සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/Audit/Ex. Audit
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2024.09.06

**සියලුම පාලක මණ්ඩල/විධායක කමිටු සභාපතිවරුන්,**

**සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති කළමනාකරුවන් වෙත.**

**විගණන මතය සමග ලබා දෙන නිරීක්ෂණ වාර්තා නිවැරදි කළ බවට තහවුරුව දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීන් මගින් ලබා ගැනීම හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුමත කර ගැනීම.**

2020, 2021 සහ 2022 වර්ෂවල විගණන මතය සමග ලබා දෙන නිරීක්ෂණ වාර්තා නිවැරදි කළ බවට තහවුරුව දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීන් මගින් ලබා ගැනීමට තීරණය කර ඇත.

02. ඒ අනුව, විගණන මතයට පදනම් කර ගත් විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු දින 14 ක් ඇතුළත අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත ද පිටපතක් සහිතව ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කළ යුතු අතර, ඉහත වර්ෂ වල විසර්ජිත ලාභය ප්‍රයෝජනයට ගැනීමට අවසර ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රකාශන අනුමත කර ගැනීමට එහි පිටපතක් බැංකු අධීක්ෂණ නිලධාරීන්ගේ තහවුරුව සහිතව අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත යොමු කළ යුතුය.

03. නිරීක්ෂණ වාර්තා වලට පිළිතුරු බැංකු අධීක්ෂණ නිලධාරීන් වෙත යොමු කර තහවුරු කර ගැනීමේදී සහ අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත යොමු කිරීමේදී ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති පහත ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

( අ ) **දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීන්ගේ තහවුරුව ලබාගැනීම.**

ඒ සඳහා පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය.

I. වර්ෂයට අදාල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය.
II. විගණන මතය.
III. විගණන මතය සමග ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තාව.
IV. නිරීක්ෂණ වාර්තාවට පිළිතුරු.

( ආ ) **දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීන් තහවුරු කරන ලද නිරීක්ෂණ වාර්තා අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත යොමු කිරීම.**

I. **සමෘද්ධි ප්‍රජාමූල බැංකුව.**

විගණන මතය සමග ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තාවේ සඳහන් කරුණු නිවැරදි කර, එසේ නිවැරදි කළ බවට බැංකු කළමනාකරු අත්සන් කර, ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුගේ නිර්දේශය, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය හා එම කරුණු නිවැරදි කළ බවට දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීගේ තහවුරුව සහිතව ඉහත අංක 03 (අ) යටතේ දක්වා ඇති ලේඛන ද සමග අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**II. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය**

විගණන මතය සමග ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තාවේ සඳහන් කරුණු නිවැරදි කර, නිවැරදි කල බවට බැංකු සමිති කලමණාකරු අත්සන් කර, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය හා එම කරුණු නිවැරදි කළ බවට දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීගේ තහවුරුව සහිතව ඉහත අංක 03 (අ) යටතේ දක්වා ඇති ලේඛන ද සමග අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
( සැ. යු. - දිනය හා නිල මුද්‍රාව සහිතව අත්සන යෙදිය යුතුය.)

04. 2020 වර්ෂයට පෙර වර්ෂ වල විගණන මතය සමග ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තා **දිස්ත්‍රික් විගණන නිලධාරීගේ තහවුරුව සහිතව බැංකු මූල්‍ය අංශය වෙත එවා නොමැති නම්** බැංකු අධීක්ෂණ නිලධාරීන්ගේ තහවුරුව ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය.

05. තවද, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය අනුමත කර ගැනීම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුගේ වගකීමක් වන අතර, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව/ බැංකු සමිතිය ලාභ ලැබුව ද, අලාභ ලැබුව ද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුමත කර ගැනීම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරු විසින් අනිවාර්යයෙන්ම කළ යුතු කාර්යයක් බව අවධාරණය කරමි.

**සී.ඩී. කළුආරච්චි**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත - 01. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.ගැ.ස.

02. අතිරේක ලේකම් (සංවර්ධන ) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.ගැ.ස.

03. ප්‍රධාන අභ්‍යන්තර විගණක , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.

04. සියලුම.දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් - කා.දැ.ගැ.ස. සහ අ.ක.ස.

05. සියලුම දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ නිලධාරීන් - අ.ක.ස.

.